වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசன மற்றும் நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
**MINISTRY OF IRRIGATION AND WATER RESOURCES & DISASTER MANAGEMENT**

කාර්යාලය / அலுவலகம் / Office } 0112665170
විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை.
Vidya Mawatha, Colombo 07, SRI LANKA
ෆැක්ස් / பெக்ஸ் / Fax } 0112665170

මගේ අංකය / எனது இல / My No. } NDRSC/1/1/1/2018-05-ii
ඔබේ අංකය / உமது இல / Your No. }
දිනය / திகதி / Date } 2018.10.19

චක්‍රලේඛ අංක - NDRSC/2018/03 (ii)

දිස්ත්‍රික් ලේකම්,
කුරුණෑගල/අනුරාධපුරය/ පුත්තලම/ මුලතිව්/ අම්පාර/ වව්නියාව/ මාතලේ/ කිළිනොච්චිය/ මන්නාරම/ යාපනය/ හම්බන්තොට/ රත්නපුර/ මඩකලපුව/ පොළොන්නරුව

<u>දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීම සඳහා 2018 නියං සහනාධාර වැඩසටහන II අදියර ක්‍රියාත්මක කිරීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද අංක NDRSC/2018/03 හා 2018.09.25 දිනැති හා අංක NDRSC/2018/03 (i) හා 2018.10.03 දිනැති චක්‍රලේඛ මෙයින් අවලංගු කරන අතර ඊට අදාළ සංශෝධිත අංක NDRSC/2018/03 (ii) චක්‍රලේඛය නිකුත් කරමි. ඒ අනුව නියං සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් පමණක් වලංගු වන බව කාරුණිකව දන්වමි.

02. දැඩි වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් පීඩාවට පත්ව ඇති ජනතාවගේ ජීවන තත්ත්වය සුරක්ෂිත කිරීම සඳහා රජය විසින් දැනටමත් ලබා දී ඇති සහන වලට අමතරව නියඟයෙන් පීඩාවට පත් ගොවීන්ට තවදුරටත් සහන සැලසීම වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන අංක පීඑස්/සීපී/51/2018 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා බැඳේ.

03. ඒ අනුව මාගේ අංක NDRSC/1/1/1-2018-5 හා 2018.07.17 දිනැති ලිපිය සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ලබා දී ඇති පවුල් සංඛ්‍යාවන් (ඇමුණුම 01) පාදක කොට ගෙන මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

04. වියළි කාලගුණික තත්ත්වය නිසා වගාව සඳහා ජලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2016/2017 මහ, 2017 යල, 2017/2018 මහ යන වගා කන්න තුනම අඛණ්ඩව වගා කිරීමට නොහැකි වූ වී වගා කරන පවුල් හා කන්න 03ම අඛණ්ඩව අතුරු බෝග වගා කිරීමට නොහැකිවූ අතුරු බෝග වගාකරන ගොවි පවුල්, වියළි කාලගුණය හේතුවෙන් ජීවනෝපාය මාර්ග අවහිරවූ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන පවුල් හා ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සිදුනොවීම හේතුවෙන් තම ජීවනෝපාය මාර්ග අවහිර වූ කෘෂි කම්කරු පවුල් සඳහා නියං සහනාධාර වැඩසටහනක් 2018.09.20 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුව ඇත. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන්, ගොවිජන සේවා සහකාර කොමසාරිස් හා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ යන නිළධාරීන්ගේ සහයෝගයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වේ.

05. ප්‍රාදේශීය ලේකම් විසින් පත්කරන ලද ග්‍රාම නිලධාරි, සමෘධි නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර යන නිලධාරීන් තිදෙනාගෙන් සමන්විත කමිටුවක් මඟින් ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා නිර්දේශ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතීත්වයෙන් යුත් කලාප භාර කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂ/කෘෂිකර්ම උපදේශක හා ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරීන්ගෙන් සමන්විත කමිටුව මඟින් මෙම වැඩසටහන සඳහා ප්‍රතිලාභී පවුල් හඳුනාගැනීම සිදුකළ යුතුය.

06. මෙම වැඩසටහන සඳහා ඉහත 03 ඡේදයේ සුදුසුකම් ලැබී ඇති පවුල් අතරින් පහත සඳහන් පවුල් හැර අනෙකුත් පවුල් තෝරාගත යුතුය.

i. රජයේ හෝ පෞද්ගලික අංශවල රැකියාවල නිරත වී හෝ ව්‍යාපාර, ස්වයං රැකියා, වෙනත් මාර්ග වලින් මාසිකව රු. 20,000/=ක් හෝ ඊට වැඩි ආදායම් ලබන පවුල්

ii. කෘෂි රක්ෂණ මණ්ඩලය මඟින් වගා හානි වූ පවුල් සඳහා ලබාදෙන රු.40,000 මුදල හෝ ඊට වැඩි මුදලකට හිමිකම් ලබන පවුල්

07. මෙම නියං සහනාධාර වැඩසටහන සඳහා පවුල් තෝරාගන්නා ලද නිර්ණායක අතුරින් නිර්ණායකයන් 02ක් හෝ ඊට වැඩි ගණනක් යටතට ගැනෙන පවුල් සඳහා නියං සහනාධාර වාරිකය සඳහා හිමිකම් ඇත්තේ එක් අවස්ථාවක් සඳහා පමණි.

08. තෝරාගන්නා පවුල්වලින් එක් සාමාජිකයෙකු බැගින් ප්‍රාදේශීය ලේකම් විසින් හඳුනාගනු ලබන මිනිස් ශ්‍රමයෙන් සිදු කළ හැකි සුළු පරිමාණ සංවර්ධන කටයුතු (උදාහරණ ලෙස කුඩා පරිමාණ වැව් අමුණු හා ඇළ වේලි ආදිය පිළිසකර කිරීම, ගොවි බිම් සඳහා අවශ්‍ය මංමාවත් එළි පෙහෙළි කිරීම, ග්‍රාමීය මාර්ග පිළිසකර කිරීම, කානු පද්ධති පවිත්‍ර කිරීම හෝ සැකසීම වැනි) සඳහා මසකට දින 05ක කාලයක් සඳහා යොදවා ගැනීම සිදු කළ යුතුය.ඒ සඳහා අඛණ්ඩව දින 05ක් වැඩ සඳහා යොදා ගැනීම වඩා ඵලදායී වේ.

09. මෙම ගොවි පවුල්වල ජීවනෝපාය මාර්ගවලට දැඩි බලපෑමක් එල්ල වී ඇති බැවින්, කඩිනමින් පළමු නියං සහනාධාර වාරිකය ලබාදීමට කටයුතු කරන ලෙස දන්වන අතර ඉන්පසුව සුදුසු පරිදි වැඩ සතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.

10. එම හඳුනාගත් පවුල්වල සාමාජිකයින් වෛද්‍ය හේතූන් මත හෝ වයෝවෘද්ධ වීම, ආබාධිත වීම, වයස අවුරුදු 16ට අඩු දරුවන් සමඟ සිටින වැන්දඹු කාන්තාවන් වීම වැනි විශේෂ හේතූන් මත සංවර්ධන කටයුතු සඳහා සහභාගී විමට නොහැකි අවස්ථාවන් වලදී ඒ සඳහා යොදවා ගැනීමකින් තොරව මෙම සහනාධාරය ලබා දිය යුතු වේ.

11. මෙම නියං සහනාධාරය ලබා දීමේදී එහි අඩංගු විය යුතු පාරිභෝගික ද්‍රව්‍ය හා ප්‍රමාණයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | ද්‍රව්‍යයේ නම | සාමාජිකයින් 3ට අඩු පවුලක් | | සාමාජිකයින් 3 හෝ 3ට වැඩි පවුලක් සඳහා | |
|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | දළ වටිනාකම රු. | ප්‍රමාණය | දළ වටිනාකම රු. |
| 1 | සහල් | 20 Kg | 1,360.00 | 30 Kg | 2,040.00 |
| 2 | බිත්තර | 10 | 145.00 | 10 | 145.00 |
| 3 | පරිප්පු | 2 Kg | 220.00 | 3 Kg | 330.00 |
| 4 | දේශීය අර්තාපල් | 2 Kg | 240.00 | 2 Kg | 240.00 |
| 5 | තේ කොළ | 200g | 260.00 | 200g | 260.00 |
| 6 | සීනි | 1 Kg | 100.00 | 2 Kg | 200.00 |
| 7 | තිරිඟු පිටි | 2 Kg | 208.00 | 2 Kg | 208.00 |
| 8 | සෝයා මීට් 70 g | පැකට් 10 | 325.00 | පැකට් 10 | 325.00 |
| 9 | කඩල | 2 Kg | 330.00 | 2 Kg | 330.00 |
| 10 | කිරි පිටි | 400g | 310.00 | 400g | 310.00 |
| 11 | මිරිස් කුඩු | 250 g | 195.00 | 250 g | 195.00 |
| 12 | තුනපහ කුඩු | 250 g | 185.00 | 250 g | 185.00 |

12. පසුගිය සහනාධාර වැඩසටහන්වලදී ලබා දුන් භාණ්ඩවල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව විවිධ පැමිණිලි ඉදිරිපත් වූ බැවින් සියළුම ප්‍රතිලාභීන් වෙත උසස් ගුණාත්මක බවකින් යුතු හා ප්‍රමාණාත්මකව නිවැරදි වන සහනාධාර මල්ලක් ලබාදීමේ අරමුණින් නියං සහනාධාර II අදියරෙහි වැඩසටහන පහත පරිදි ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

13. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ අවශ්‍ය භාණ්ඩ ප්‍රමාණයන් සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සංගමය මඟින් මිලදී ගෙන එම භාණ්ඩ මෙම අමාත්‍යාංශයේ නම සඳහන් පොලිසැක් කවරතුළ මධ්‍යම ගබඩා සංකීරණයන්හි දී ඇසුරුම් කරනු ලැබේ. එහි දී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, අප අමාත්‍යාංශය හා සමූපකාර දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගෙන් යුතු කමිටුවක් විසින් තත්ත්ව පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව සහනාධාර මළු ප්‍රාදේශීය ලේකම් විසින් නම්කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් කිහිපයක් ආවරණය වන පොදු ස්ථාන වෙත ප්‍රවාහනය කිරීම සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමූපකාර සමිති සංගමය මඟින් සිදු කරනු ලබයි.

14. එම සහනාධාර මළු ප්‍රතිලාභීන් වෙත බෙදාහැරීමේ දී මෙම චක්‍රලේඛය මඟින් හිමිකම් ලබන ප්‍රතිලාභීන් වෙතම ප්‍රමාණාත්මකව නිවැරදි හා ගුණාත්මකභාවයෙන් යුතුව ලබා දෙන බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කරගත යුතු බවට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

15. ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි එක් එක් මසට අදාළව සහනාධාර මළු නිකුත් කරන ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා එම ප්‍රතිලාභීන් වෙත ලබා දුන් සහනාධාරයෙහි වටිනාකම අදාළ මාසය අවසානයේදී මා වෙත වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.

16. තව ද මෙම සහනාධාර ලබා දීම පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වා ගත යුතු බැවින් ඇමුණුම 01 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කරන ලද ප්‍රතිලාභීන් පිළිබඳ තොරතුරු සංයුක්ත තැටියක් මඟින් හෝ විද්‍යුත් තැපැල මඟින් මාසිකව මා වෙත ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලමි.

17. මෙම නියං සහනාධාර බෙදාහැරීමේදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සම සභාපතිවරුන් මෙම වැඩසටහන සඳහා සම්බන්ධ කරගන්නා මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

18. තවද, නියං සහනාධාර බෑම, පැටවීම, ප්‍රවාහන කිරීම හා ඒ සම්බන්ධව වන වෙනත් වියදම් දැරීමට එක් ප්‍රතිලාභී පවුලක් වෙනුවෙන් නිකුත් කරනු ලබන නියං සහනාධාර ද්‍රව්‍ය සඳහා රු.25 බැගින් අදාළ ප්‍රතිලාභ සැලසූ පවුල් සංඛ්‍යාව පදනම්ව අවශ්‍ය ප්‍රතිපාදන ඔබ වෙත වෙන්කර දෙනු ලැබේ. ඒ සඳහා මෙම කාර්යය අවසන් වූ පසු ඔබ විසින් උක්ත කාර්යය සඳහා දරන ලද වියදම අදාළ සීමාවට යටත්ව ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය වාරිමාර්ග සහ ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ඉංජිනේරු.එන්.ඒ.සිසිර කුමාර
ලේකම්
වාරිමාර්ග සහ ජලසම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය

<u>පිටපත් -</u>

| | | |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය | - කරු. දැ.ගැ.ස. |
| 2. | ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 3. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 4. | ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 5. | ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 6. | ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස. |
| 7. | සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් | - කරු. දැ.ගැ.ස. |
| 8. | කොමසාරිස්, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. අ.ක.ස. |
| 9. | සභාපති, සමූපකාර තොග වෙළඳ සංස්ථාව | - කරු. අ.ක.ස. |